Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2024), Vol. 09 (01)

# A Comparative Study of the Use of Atamagala in Suniyam Shanthikarmaya in the Upcountry, Lowcountry and Sabaragamu Traditions

A. D. H. P. Aluthge[1*] and W. V. P.H. Ranaweera[1,2]

[1]Department of Languages, Cultural Studies and Performing Arts, [2]International Center for Multidisciplinary Studies, University of Sri Jayewardenepura, Sri Lanka

**Article Info**

Article History:
Received 20 Aug 2023
Accepted 13 Nov 2023
Issue Published Online
01 January 2024

**Key Words:**
Atamagala
Sooniyama
Shanthikarmaya
Rangasarasili
Vinakapeema

*Corresponding author
E-mail address:
heshanialuthge94@gmail.com

https://orcid.org/0009-0003-6014-4487

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v09i01.13

VJHSS (2024), Vol. 09 (01), pp. 197-210

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

Faculty of Humanities and Social Sciences 2024

## ABSTRACT

*Atamagala is an unique cultural aspect related to Sinhala folk practices & applications. Among them, the use of Atamagala is more famous as a decoration of Shanthikarma. Sooniyam Shanthikarmaya, which is conducted with the primary objective of eliminating witchcraft, is unique among the Shanthikarma used in Atamagala. The primary objective was to study the use of Atamagala, which is a decoration included in the Souniyam Shanthikarma, which is held with regional diversity in the Upcountry, Lowcountry and Sabaragamuwa, in a comparative manner and does the use and utility of Atamagala change in aforementioned traditions was the research problem. This research utilizes the human genealogical method, conducted under the qualitative method. Library study and field study were used as data collection methods. The methods of field data collection were the observation of Shanthikarma which uses Atamagala, observation of Atamagala creating method and conducting interviews with the experts in the field. Twelve data contributors were selected under judgmental sampling and snowball sampling and interviewed in this research. Atamagala is a basic arrangement built as a house, which is created by using banana pith and banana leaves and a "Yantraya" with eight corners marked inside and a mat is spread in such a way that the patient can sit on it. The primary objective of Atamagala practice is to remove the dosha of the patient. According to the three traditions, diversity can also be identified in the preparation of Atamagala and related rituals in Sooniyam Shanthikarmaya. Although, the Atamagala is a formal structure in Lowcountry and Sabaragamuwa traditions, it is a primitive structure in Upcountry Sooniyam Shanthikarmaya. It is also an unique custom not to cut Atamagala in Upcountry and Sabaragamu tradition. Accordingly, the research is concluded with the fact that the use and utility of Atamagala in Sooniyam Shanthikarma varies according to the traditions.*

**මාතෘකාව**

උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායයන්හි සූනියම් ශාන්තිකර්මයේ අටමඟල භාවිතය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

## 1. හැඳින්වීම

### 1.1 ශාන්තිකර්ම හැඳින්වීම

අදෘශමාන බලවේගයන්ගෙන් ඇති වන්නා වූ විවිධ කරදර, විපත්, රෝගාබාධවලින් අත්මිදීම උදෙසාත් සෙතක් ශාන්තියක් අත්පත් කර ගැනීම උදෙසාත් පවත්වනු ලබන අභිචාරමය චාරිත්‍ර ඇතුළත් පූජා කර්මයන් වන ශාන්තිකර්ම දේශීය නර්තන කලාවේ කෝෂ්ඨාගාරය යි. මිනිසා තුළ ගැඹුරින් මුල් බැසගෙන ඇති භීතිකා ඉවත් කර මානසික සමතුලිතතාවක් ඇති කිරීම නැතහොත් පුද්ගලයා තුළ විශ්වාසය ඇති කර වීම මෙම ශාන්තිකර්මවල මූලික අරමුණ වේ (Kainga Dona, 2016). ඒ අනුව උඩරට, පහතරට හා සබරගමු වශයෙන් සම්ප්‍රදායන් ත්‍රිත්වයට ආවේණික වූ ශාන්තිකර්ම විධි සමූහයක් ඇත. ඒවා තොවිල්, බලියාග හා මඩු ස්තෝත්‍ර යනුවෙන් සැකෙවින් කොටස් තුනකට බෙදා දැක්විය හැකි ය (ගුණසිංහ, 2014). බලි යනු ග්‍රහයන්ගෙන් වන අශුභ බලපෑම් ඉවත් කර, සුවපත්භාවය ඇතිකර ගැනීමට සිදු කරනු ලබන ශාන්තිකර්ම වන අතර, තොවිල් යනු යක්ෂයන්ගෙන් ඇති වන කරදර විපත් දුරු කර ගැනීම උදෙසා පවත්වනු ලබන සුව කිරීමේ චාරිත්‍ර යි (Kainga Dona, 2016). මෙම කොටස් ද්විත්වයට අමතර ව දෙවියන් පිදීම හා සම්බන්ධ වූ ශාන්තිකර්ම මඩු ස්තෝත්‍ර වශයෙන් හැඳින්වේ.

බුදුදහම මෙරටට පැමිණීමට පෙර සිට ම යකුන්, යක්ෂණියන්, මළගියවුන් පිදීම හා සම්බන්ධ අභිචාරමය ඇදහිලි හා පූජාකර්ම මෙරට මුල් බැස ගෙන තිබූ බව වංශකථාගත තොරතුරු අනාවරණය කරයි. ක්‍රි.ව. 4 වන සියවසේ පණ්ඩුකාභය රාජ්‍ය සමයේ චිත්තරාජ, කාලවේල, සහ වලවාමුඛි යන යක්ෂ යක්ෂණියන් උදෙසා බලි පූජා කිරීමට නියෝග කර තිබිණි (රාහුල හිමි, 1970). එමෙන් ම වරින් වර මෙරටට ඇති වූ ඉන්දීය ආක්‍රමණ හා සංක්‍රමණ සමග විවිධ යුගයන්හි දී ශාන්තිකර්ම විෂයයෙහි ලක්වැසියන් අතර උද්යෝගයක් වර්ධනය වුව ද, දේශීය වශයෙන් ශාන්තිකර්ම ක්‍රමයක් ඇති කර ගැනීමේ අවශ්‍යතාව මතු ව ඇත්තේ කෝට්ටේ රාජධානි සමයේ දී ය. කෝට්ටේ යුගයේ දී රජවරුන් දකුණු ඉන්දියාව සමග පැවැත්වූ සබඳතා මත බෞද්ධ විහාර ගෘහයට දේවාලය ද සම්බන්ධ විය. කෝට්ටේ රාජධානිය සුරැකීමට පවා සතර දිගින් දේවාල සතරක් ඉදි කර ඇත. එහෙයින් බුදුන් ඇදහීමට මෙන් ම දෙවියන් ඇදහීමටත්, යාග හෝම, ග්‍රහ පූජා ආදිය පැවැත්වීමටත් සමකාලීන ජනයා පුරුව සිටියහ (ගුණසිංහ, 2014).

බුදුදහම මෙරටට පැමිණි පසුව ද අතීතයෙන් ශේෂ වූ අභිචාරමය ඇදහිලි හා පූජා කර්මයන් යම් බඳු ප්‍රමාණයකට ලාංකික සිංහල සමාජයෙහි මුල්බැස ගෙන තිබූ බව අට්ඨකථාවලින් අනාවරණය වේ. ඒ අනුව බුද්ධඝෝෂ හිමියන් විසින් රචනා කරන ලද සුමංගල විලාසිනි අට්ඨකථාවේ සඳහන් වන්නේ සමකාලීන ව යම් කෙනෙකුහට යක්ෂ බලපෑමක් ඇති වූ විට භූත වෛද්‍යවරුන් රාත්‍රී කාලයේ සොහොන් පිටිවල රෝග සුව කිරීම සඳහා විවිධ අභිචාරමය ක්‍රමවේදයන් සිදු කළ බව යි (1918). කෝට්ටේ යුගයෙහි දී ඉන්දියානු හින්දු සම්ප්‍රදාය ශාන්තිකර්ම අතර ජනප්‍රිය වුව ද, මෙම යුගයෙහි දී එය බෞද්ධාගමට අනුගත වන ආකාරයෙන් බුදු දහමට අනුව බෞද්ධ චාරිත්‍ර ඇතුළත් ශාන්තිකර්ම සම්ප්‍රදායක් බවට පරිවර්තනය වී ඇත (Jinadasa, 2016). බලි ශාන්තිකර්මය මීට හොඳ ම නිදසුනක් වශයෙන් සඳහන් කළ හැකි ය. එමෙන් ම කෝට්ටේ යුගයේහි දී හය වන පැරකුම්බා රජුගේ රෝගී අවස්ථාවේ එම රෝග සුව කිරීමට කොහොඹාකංකාරි ශාන්තිකර්මයක් ද පැවැත් වූ බව කියැවේ (කුලතිලක, 2007). ඒ අනුව කෝට්ටේ යුගයේ දී ශාන්තිකර්ම සඳහා රජවරුන්ගේ ද සහාය ලැබීමෙන් අනාවරණය වන්නේ මෙම යුගය සාහිත්‍යමය වශයෙන් පමණක් නොව ශාන්තිකර්ම සම්බන්ධයෙන් ද ස්වර්ණමය යුගයක් ව පැවති බව යි.

මෙලෙස විවිධ අවස්ථාවන්හි ග්‍රහයන්, දෙවියන් හා යකුන් පිළිබඳ විශ්වාස හා එම බලවේගයන්ගෙන් ඇති වන දෝෂ, දුරු කර ගැනීමට ශාන්තිකර්ම පැවැත්වීම විසඳුමක් වන බව ලාංකේය සමාජයේ මිනිසුන් තුළ මුල්බැස ගත් අතර, එම ශාන්තිකර්ම දේශීය නර්තන සම්ප්‍රදායන් යටතේ විභේදනය වී බලි ශාන්තිකර්ම, යක් තොවිල්, මඩු ශාන්තිකර්ම වශයෙන් ප්‍රධාන කොටස් ත්‍රිත්වය යටතේ ඉතා විධිමත් පූජා චාරිත්‍ර රටාවක් අනුව වර්ධනය වී ඇත.

### 1.2 සූනියම් ශාන්තිකර්මය හැඳින්වීම

උඩරට, පහතරට හා සබරගමු වශයෙන් විභේදනය වී ඇති එක් එක් ප්‍රදේශයන්හි ඒ ඒ සම්ප්‍රදායන්ට අනුව සිදු කරනු ලබන ශාන්තිකර්ම සමූහයක් ව්‍යවහාරයේ පවතී. ඒ

අනුව එම ශාන්තිකර්ම බලියාග, මඩු ස්තෝත්‍ර හා යක් තොවිල් වශයෙන් වෙන් කොට ඒ ඒ පුද්ගලයාගේ හෝ ප්‍රදේශයේ අවශ්‍යතාව අනුව සිදු කරනු දක්නට ලැබෙයි. සූනියම් ශාන්තිකර්මය යනු සම්ප්‍රදායන් ත්‍රිත්වයට ම පොදු වූ ශාන්තිකර්මයකි. මෙම ශාන්තිකර්මය උඩරට ප්‍රදේශයේ "සූනියම් කැපීමේ ශාන්තිකර්මය" වශයෙන් ද, පහතරට ප්‍රදේශයේ දී "සූනියම් යාගය" හා "මැණික්පාල ශාන්තිය" වශයෙන් ද සබරගමු ප්‍රදේශයේ "බඹ පාද කැපීම" නැතහොත් "ඡේදන වීදි ශාන්තිකර්මය" වශයෙන් ද ව්‍යවහාර කරනු ලබයි.

රෝගී පුද්ගලයාගේ අවශ්‍යතාව අනුව රෝග විනිශ්චය කිරීමෙන් පසු ශාන්තිකර්මය පැවැත්වීම සිදු වන ආකාරය විවිධ වන බව පාරම්පරික සූනියම් ඇදුරන්ගේ අදහස යි. මෙම ශාන්තිකර්මය යක් තොවිල් ගණයේලා සැලකුව ද ගරුසිංහ පෙන්වා දෙන්නේ එය යක් තොවිලයක් වශයෙන් පමණක් හැඳින්වීමට සාම්ප්‍රදායික ඇදුරන් මැලි වන බව යි. එයට හේතුව වී ඇත්තේ සූනියම් ශාන්තිකර්මයේ දී ප්‍රධාන ව පුද ලබන සූනියම් යක්ෂයා, දේවතාවකු වශයෙන් ද පිදුම් ලබන බැවිනි (2007).

සූනියම හා සම්බන්ධ අංශ දෙකක් ඇත. එනම් සූනියම් කිරීම හා සූනියම් කැපීම වශයෙනි. සූනියම් කිරීම යනු යම් විරුද්ධකාරයකුට කායික හෝ මානසික පීඩාවක් ඇති කිරීම උදෙසා සිදු කරනු ලබන ගුරුකමකි. සූනියම් කැපීම යනු මෙසේ කෙනෙකුට කරන ලද සූනියමක් ඉවත් කිරීමට නැතහොත් කපා දැමීමට කරන තොවිලයකි (ගුණසිංහ, 2014). "සූනියම වශයෙන් හඳුන්වනු ලබන්නේ 'විනය' හෙවත් 'කොඩිවිනය' යි. එම විනය කැපීම සූනියම් කැපීම යි" (කෝට්ටේගොඩ, 2009, 102). සූනියම් කැපීම රහසිගත ව සිදු කළ යුතු ය. මීට අමතර ව මිනිසුන් විසින් තවත් අයෙකු හට ඇති කර වන ඇස්වහ, කටවහ, හෝවහ, අඩෝ ඇඬියා ආදිය ද සූනියම් දෝෂ වන බැවින් එම සමස්ත දෝෂ දුරු කර ගැනීම සඳහා සූනියම් යාග ශාන්තිකර්ම පොදුවේ පවත්වනු ලබයි.

මෙම සූනියම් ශාන්ති ශාන්තිකර්මය ඒ ඒ පුද්ගලයාගේ වත් පොහොසත්කම් හා දෝෂයේ ස්වභාවය අනුව අඩු වැඩි වශයෙන් චාරිත්‍ර, සැරසිලි ආදිය සහිත ව සිදු කරනු ලබන බව ඇදුරෝ පෙන්වා දෙති. ඒ අනුව සම්පූර්ණ වත් පිළිවෙත් හා අලංකාර සැරසිලි සහිත ව පවත්වනු ලබන සූනියම් කැපීම "සූනියම් ශාන්තිකර්මය" ලෙස හඳුන්වන අතර, එලෙස විචිත්‍ර ලක්ෂණයන්ගෙන් තොරව හත් අඩියේ දෙහි කැපීම මූලික කර ගනිමින් කරනු ලබන සූනියම් කැපීම "සූනියම් භාගය" ලෙස ද හඳුන්වනු ලබයි (කෝට්ටේගොඩ, 2009). මෙම ලක්ෂණය උඩරට, පහතරට හා සබරගමු වශයෙන් සම්ප්‍රදායන් ත්‍රිත්වයේ දී ම අනුගමනය කිරීම හඳුනාගත හැකි ය.

සූනියම් ශාන්තිකර්මය පැවැත්වීමට මූලික වූ පුරාකථාවක් ද ඇත. එය වසවර්ති මාරයා සහ මැණික්පාල බිසව වටා ගොඩ නැගී තිබේ. මෙම කථා පුවතට අමතර ව සූනියම් යාගය හා සම්බන්ධ තවත් උපත් කථාවක් වශයෙන් " මල්සරා සැහැල්ල" දැක්විය හැකි ය. මාතර ප්‍රදේශයේ ඇදුරෝ මෙම කථා ප්‍රවෘත්තිය භාවිත කරති (ගරුසිංහ, 2007). එහෙත් සූනියම් ශාන්තිකර්මයේ උපත් කථාව ලෙස සෑම මූලාශ්‍රයක ම පාහේ සටහන් ව ඇත්තේ මහාසම්මත රජුගේ බිසව වූ මැණික්පාල බිසව හා වසවතු හා සම්බන්ධ කථා ප්‍රවෘත්තිය යි. මෙය උඩරට, පහතරට මෙන් ම සබරගමු සූනියමේ ද උපත් කථාව ලෙස සලකනු ලබයි. එහෙත් එම කථා ප්‍රවෘත්තියෙහි විවිධ පළාත් අනුව යම් ප්‍රාදේශීය විෂමතා තිබේ (ගරුසිංහ, 2007). මෙලෙස එදා මැණික්පාල බිසවට ඇති වූ වින දෝෂය දුරු කිරීමට සිදු කළ සූනියම් ශාන්තිකර්මය, වර්තමානය වන විට ද වින දෝෂ දුරු කර සෙත් ශාන්තිය ළඟා කර ගැනීම උදෙසා පවත්වනු ලැබේ.

**1.3 අටමඟල හැඳින්වීම**

අටමඟල යනු සිංහල ජන ව්‍යවහාරයේ සහ භාවිතයේ පවතින එක් ප්‍රධාන සංස්කෘතිකාංගයකි. එහි උපයෝගීතාව හා භාවිතය අවස්ථානුකූල ව විවිධ වන අතර සමාජීය හා විද්‍යාත්මක පදනමක් සමග බැඳෙමින් දීර්ඝ කාලයක් පුරා සිංහල ජන දිවිය හා බැඳී ඇත. සිංහල සංස්කෘතියෙහි "සුබ" නැතහොත් මංගල අවස්ථා සඳහා අටමඟල භාවිත කරයි. නව නිවසක් සඳහා අත්තිවාරම් යෙදීම, විහාරාරාම නිර්මාණය කිරීම, බුදුපිළිමවල නේත්‍ර ප්‍රතිෂ්ඨාපනය කිරීම, මල්වර උත්සව, කමත, ශාන්තිකර්ම ආදිය එසේ අටමඟල භාවිත කරන සුවිශේෂ අවස්ථා වේ (අලුත්ගේ, 2020-2021).

උක්ත අවස්ථා හා සැසඳීමේ දී "අටමඟල" සුබ සලකුණක් වශයෙන් සැලකුව ද, ජන ව්‍යවහාරයේ දී "අටමඟල" යන්න කිසියම් බාධාවක්, කරදරයක් නැතහොත් ඵල ප්‍රයෝජනයක් නැති අබලන් ද්‍රව්‍යයක් සංකේතවත් කිරීමට ව්‍යවහාර වන ජන වහරක් ලෙස ද යෙදේ. එහෙත් නිරුක්ති අධ්‍යයනයේ දී අනාවරණය වන්නේ "අටමඟල" යන සංකල්පයෙන් එසේ ඵල ප්‍රයෝජනයක් නොමැති දෙයක් ගම්‍ය නො වන බව යි. " අටමඟල" පිළිබඳව යෙදී ඇති අර්ථ නිරූපණ රැසක් මූලාශ්‍රයන්හි ඇත. එයින් ප්‍රධානතම අර්ථ දැක්වීම වන්නේ "අටමඟල" යනු "අෂ්ට මංගල" නැතහොත් "මඟුල් කරුණු අට" යන්න යි. මීට අමතර ව අටමඟල පොළොවෙහි අඳිනු ලබන රූපයක් වශයෙන් ද, මණ්ඩප විශේෂයක් වශයෙන් ද හඳුන්වා දී ඇත (හෙට්ටිආරච්චි, 1963). එහෙත් ඇතැම් මූලාශ්‍රයක අටමඟල යනු "පිළිවෙළක් නොමැති ව සැදූ මඩුවකි" (විජයතුංග, 1982, 31) යනුවෙන් උක්ත ප්‍රකාශිත ජන ව්‍යවහාරයට සමාන වන අර්ථ දැක්වීම් ද හඳුනාගත හැකි ය.

සිංහල ජන ආගමෙහි සුබ ඵල උදා කර දෙනු වස් ඉටු කරනු ලබන සුවිශේෂ කර්තව්‍යයක් ලෙස ශාන්තිකර්ම ජන සම්ප්‍රදායෙහි ක්‍රියාත්මක වන අතර "අටමඟල" ද රංග සැරසිල්ලක් මෙන් ම අභිචාරමය සංකේතයක් ලෙසින් ශාන්තිකර්ම සමග බද්ධ වී ඇත. ශාන්තිකර්මයේ දී අටමඟලෙහි ව්‍යුහය හා ආකෘතිය විවිධාකාර වේ. රූප සටහනක් වශයෙන් බිම සහල් මත හෝ අළු මත සලකුණු කරමින් රූප සටහනක් වශයෙන් දැක්වීමත්, සහල් මත ඇඳි යන්ත්‍රයක් මත තොලබෝ, හීරැස්ස, දිවි හිස, මොහොල් ගස, පඬුරු, පහන්, පොල් ආදී වශයෙන් වස්තු අටක් තැන්පත් කිරීමත් කෙසෙල් බොඩ, කෙසෙල් පතුරු, පට්ටා ආදිය යොදා ගෙන තනනු ලබන මණ්ඩපයක් ආකාරයටත් අටමඟලෙහි භාවිතය විවිධ වේ.

ඒ අනුව උඩරට සම්ප්‍රදායේ බලි යාගය, සූනියම් යාගය, කොහොඹා කංකාරිය, කඩවර කංකාරිය වැනි ශාන්තිකර්මයන්හි දීත් පහතරට සම්ප්‍රදායේ බලි, සූනියම් යාගය, සන්නියකුම, කළු කුමාර යාගය වැනි ශාන්තිකර්මයන්හි දීත් සබරගමු සම්ප්‍රදායේ බලි, සූනියම හෙවත් බඹ පාද කැපීම, දෙහි තොවිලය, හැන්දෑ සමයම වැනි ශාන්තිකර්මයන්හි දීත් අටමඟල භාවිත වේ. මෙම ශාන්තිකර්ම අවස්ථාවන් හැරුණු විට මෙකී ශාන්තිකර්ම මෙන් එතරම් ව්‍යාප්තියක් දක්නට නොලැබෙන සොහොන් යක්ෂයාට පිදේනි ලබාදීම, තොටයක් තොවිලය වැනි අප්‍රචලිත ශාන්තිකර්ම අවස්ථාවන්හි දී ද අටමඟල භාවිත කරයි (දිසානායක, 1996 ; උඩවත්ත, 2006).

එමෙන්ම සම්ප්‍රදායන් ත්‍රිත්වයේ ම බලි යාග සඳහා කළාලය මත ඇතිරූ සහල් මත අටකොන් සහිත යන්ත්‍රයක් ඇඳ ඒ මත පොල්, මොහොල්, දිවි හිස, තොලබෝ, හීරැස්ස, පඬුරු ආදිය තැන්පත් කරමින් සකසන අටමඟල සැකසීමක් සිදු කරනු ලබන අතර, පහතරට බලි යාගයේ දී පමණක් මෙම සැකැස්මට අමතර ව කෙසෙල් බොඩ, කෙසෙල් පතුරු, පට්ටා, ලී කෝටු යොදා ගෙන ගෘහයක් වශයෙන් අටමඟල සකසා එය ඇතුළත පොල් මලක් දැමූ කළසක් තැන්පත් කිරීමේ සම්ප්‍රදායක් දක්නට ඇත. පහතරට බලි යාගයේ දී එය අටමඟල වශයෙන් ව්‍යවහාර කරනු ලබන අතර කළාලය මත සකසන සැකැස්ම අෂ්ට මංගල වස්තු වශයෙන් පමණක් ව්‍යවහාර වේ (බෙන්තරගේ, 2007).

කළාලය මත සහල් අතුරා අට කොන් සහිත යන්ත්‍රයක් ඇඳ ඒ මත මංගල වස්තු අටක් තැන්පත් කරමින් සකසන අටමඟල මින් ඉහත සඳහන් කර ඇති සෑම ශාන්තිකර්මයක ම දක්නට ලැබුණ ද සූනියම් ශාන්තිකර්මයේ භාවිත අටමඟල එම භාවිතයන්ට වඩා වෙනස් ස්වරූපයක් ගනු ලබන බව හඳුනාගත හැකි ය.

සූනියම් ශාන්තිකර්මයේ සැරසිලි අතර " අටමඟල" සුවිශේෂ වේ. සූනියම් ශාන්තිකර්මයේ අටමඟල කෙසෙල් බොඩ, කෙසෙල් පතුරු, ලී කෝටු, පට්ටා ආදිය යොදා ගනිමින් ගෘහයක් ආකාරයට සකසයි. මෙය පහතරට බලියේ ද දක්නට ලැබුණ ද, සූනියම් ශාන්තිකර්මයේ මෙන් විශාල නොවන අතර, එලෙස අටමඟල භාවිත කිරීමේ පරමාර්ථයෙන් ද වෙනස් වනු ඇත. පහතරට බලි යාගයේ දී එය දෘෂ්ටිගෝචර මංගල සංකේතයකි. එහෙත් සූනියමේ දී අටමඟල ආතුරයා සියලු දෝෂවලින් මුදාලන ගෘහයක් වශයෙන් හා ඒ හා බැඳි අභිචාරමය චාරිත්‍ර රැසක් ඉටු කිරීමට පාදක වන සැරසිල්ලක් වශයෙන් භාවිත වේ.

උඩරට, පහතරට හා සබරගමු වශයෙන් ප්‍රදේශීය හා සාම්ප්‍රදායික විවිධතා සහිත ව සිදු කෙරෙන සූනියම් ශාන්තිකර්මය හා බැඳි අටමඟල පිළිබඳ විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ විෂය පථය විය.

උඩරට, පහතරට හා සබරගමු වශයෙන් සම්ප්‍රදායන් ත්‍රිත්වයෙහි ම පවත්වනු ලබන සූනියම් ශාන්තිකර්මයේ භාවිත අටමඟල පිළිබඳව තුලනාත්මක ව අධ්‍යයනය කිරීම පර්යේෂණයේ මූලික අරමුණ විය. සම්ප්‍රදායන් ත්‍රිත්වයට ආවේණික ව අටමඟලෙහි නිර්මාණ ක්‍රමවේදය හා ඊට අවැසි අමුද්‍රව්‍ය පිළිබඳ අධ්‍යයනය මෙන් ම අටමඟල හා බැඳුණු අභිචාරමය චාරිත්‍ර පිළිබඳ අධ්‍යයනය කිරීම, ද්විතීයික අරමුණු වේ. අටමඟල භාවිතය හා උපයෝගීතාව උක්ත සම්ප්‍රදායානුකූල විවිධතා ප්‍රකට කරන්නේ ද යන්න පර්යේෂණ ගැටලුව විය.

දේශීය ශාන්තිකර්මයන්හි භාවිත ප්‍රධාන සංකල්පයක් වන "අටමඟල" පිළිබඳ සිදු කරනු ලබන මෙම පර්යේෂණයේ දී සාහිත්‍යමය මූලාශ්‍රය ඉතා වැදගත් විය. ඒ අනුව අටමඟල හඳුනා ගැනීම, සිංහල සංස්කෘතියෙහි අටමඟල භාවිත වන අවස්ථා හා භාවිත වන ස්වරූපය හඳුනා ගැනීම, දේශීය ශාන්තිකර්මවල අටමඟල භාවිත වන අවස්ථා හා ස්වරූපය හඳුනා ගැනීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය භාවිත කෙරිණි. ශාන්තිකර්ම විෂයෙහි යොදා ගනු ලබන රංග සැරසිල්ලක් වශයෙන් අටමඟල පිළිබඳ විග්‍රහයන් සාහිත්‍ය මූලාශ්‍රයන්හි දක්වා තිබුණ ද කේවල සංස්කෘතික සංකේතයක් වශයෙන් ශාන්තිකර්ම විෂයෙහි ලා අටමඟලෙහි භාවිතය හා උපයෝගීතාව හෝ ඒ පිළිබඳව කරන ලද ගැඹුරු සමාජීය, සංස්කෘතික හා විද්‍යාත්මක විග්‍රහයක් සාහිත්යික මූලාශ්‍රය අධ්‍යයනයේ දී හඳුනා නො ගන්නා ලදී. ඒ අනුව මෙම පර්යේෂණය දේශීය වශයෙන් අටමඟල නම් සංස්කෘතික අංගයෙහි ජන ව්‍යවහාරය පිළිබඳව කරන ලබන ජනශ්‍රැති අධ්‍යයනයක් ලෙස හැඳින්විය හැකි වේ.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

උඩරට, පහතරට හා සබරගමු වශයෙන් සම්ප්‍රදායන් ත්‍රිත්වයේ සූනියම් ශාන්තිකර්මයෙහි භාවිත"අටමඟල" පිළිබඳ සිදු කරනු ලබන මෙම පර්යේෂණය ජනශ්‍රැති අධ්‍යයනය යටතට ගැනෙන්නකි. "අටමඟල" නම් වූ සංස්කෘතික සංකේතය පිළිබඳව මානව ප්‍රජාවගේ දෘෂ්ටියෙන් විශ්ලේෂණය සිදු කළ යුතු වූ හෙයින් මානව වංශ පර්යේෂණයක් සේ ක්‍රියාවට නැංවිණි. ඒ අනුව මෙම පර්යේෂණයට ප්‍රස්තුත වූ අධ්‍යයන අරමුණු සාධනය කර ගනු වස් උද්ගාමී තර්කන ක්‍රමය යොදා ගන්නා ලද අතර, රැස්කර ගත් දත්ත තේමාත්කව විශ්ලේෂණය කරමින් නිගමනයන්ට එළඹිණි.

විෂයමූලවාදී ප්‍රවේශයක් යටතේ සිදු කරන ලද මෙම පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ප්‍රධාන අංශ ද්විත්වයක් යටතේ සිදු විය. එනම් පුස්තකාල අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය යනුවෙනි. පුස්තකාල අධ්‍යයනය යටතේ පර්යේෂණයේ විෂය ක්ෂේත්‍රයට ඍජු ව හෝ වක්‍ර ව දායක වන ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කරන ලදී. ක්ෂේත්‍ර අධ්‍යයනයන්හි දී ඇදුරන් සතු අත්පිටපත් හා වංශකථා ප්‍රාථමික මූලාශ්‍රය යටතේ පරිශීලනය කරනු ලැබූ අතර ද්විතීයික මූලාශ්‍රය යටතේ "අටමඟල" පිළිබඳ හා ශාන්තිකර්ම සාහිත්‍යය පිළිබඳ දත්ත අන්තර්ගත ග්‍රන්ථ, නිබන්ධන, සඟරා ආදිය පරිශීලනය කරනු ලැබිණි.

සාහිත්‍යයික මූලාශ්‍රය ඔස්සේ අනාවරණය කර ගත් දත්ත තහවුරු කර ගැනීමටත් නව දත්ත සම්පාදය කර ගැනීමටත් ක්ෂේත්‍ර අධ්‍යයන අවශ්‍ය වේ. පර්යේෂණ විෂය පථයේ ස්වභාවය අනුව විෂයමූලවාදී ප්‍රවේශයක සිට ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කරන ලද අතර, අර්ථනිරූපණවාදය අනුව යමින් දත්ත රැස් කිරීම සඳහා වක්‍ර සහ ඍජු නිරීක්ෂණ මෙන් ම සම්මුඛ සාකච්ඡා ද සිදු කරන ලදී. 2022 හා 2023 වර්ෂයනට අදාළ ව ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ අටමඟල භාවිත කරන ශාන්තිකර්ම අවස්ථා හා අටමඟල නිර්මාණය කිරීමේ අවස්ථා ද නිරීක්ෂණය කරමින් ප්‍රදේශීය විෂමතා හඳුනා ගන්නා ලදී. ශාන්තිකර්මයන් සජීවී ව නිරීක්ෂණය කරමින් අටමඟල හා සම්බන්ධ වන චාරිත්‍ර අවස්ථා ගැඹුරින් අධ්‍යයනය කරන ලද අතර, එවන් අවස්ථා හා සම්බන්ධ වූ පාරම්පරික ඇදුරන් සමග සම්මුඛ සාකච්ඡා ද පවත්වන ලදී. එමෙන්ම ශාන්තිකර්ම විෂය ක්ෂේත්‍රය හා ජනශ්‍රැති අධ්‍යයනයෙහි නිරත ප්‍රාමාණික විද්වතුන් ද, භාෂා විශාරදයන් ද දත්ත දායකයන් ලෙස යොදා ගැනිණි.

සූනියම් ශාන්තිකර්මය හා සම්බන්ධ විෂයෙහි ප්‍රාමාණිකයන් සුලබ නො වන හෙයින් අධ්‍යයන නියැදිය සකසා ගැනීමේ දී විනිශ්චයමය නියැදීම් ක්‍රමය හා හිමබෝල නියැදීම භාවිත කෙරිණ. ඒ අනුව සම්මුඛ සාකච්ඡා සඳහා දත්ත දායකයන් ලෙස දොළොස් දෙනකුගෙන් යුතු නියැදියක් යොදා ගන්නා ලදී. ක්ෂේත්‍ර අධ්‍යයන ඔස්සේ නිරීක්ෂණය කරන ලද හා එමගින්

ප්‍රත්‍යක්ෂ කරගන්නා ලද දත්ත තේමාත්මක ව විශ්ලේෂණය කරමින් නිගමනයන්ට එළඹිණි.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

සූනියම් ශාන්තිකර්මය වින දොස් දුරු කිරීමේ පරමාර්ථය ඇති ව උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයට ම ආවේණික ව පවත්වන ශාන්තිකර්මයකි. සූනියම් ශාන්තිකර්මයෙහි යොදා ගැනෙන සුවිශේෂ සැරසිල්ලක් වන "අටමඟලය" අනෙක් ශාන්තිකර්ම සැරසිලිවලට සාපේක්ෂව ඊට ම අනන්‍ය වූ සැකැස්මකට අනුව සූනියම් ශාන්තිකර්මයේ දී නිර්මාණය කරයි. ශාන්තිකර්මයකින් අපේක්ෂිත අරමුණු සාධනය කර ගනු වස් පුද පූජා හා නර්තන, ගායන, වාදන මෙන් ම ඒවාට යොදා ගනු ලබන රංග සැරසිලි හා පූජා ද්‍රව්‍ය ද වැදගත් වේ. ඒ අනුව බොහොමයක් ශාන්තිකර්මවල දී විවිධ අභිප්‍රේතාර්ථ සහිත ව රංග සැරසිල්ලක් ලෙස භාවිත කරනු ලබන "අටමඟලය" සම්ප්‍රදායානුකූල ව සූනියම් ශාන්තිකර්මයේ දී භාවිත වන ආකාරය, අටමඟලෙහි නිර්මාණ කාර්යය, හා අභිචාරමය චාරිත්‍රවාරිත්‍ර අවස්ථානුකූල ව වෙනස් වන ආකාරය තුලනාත්මක ව පර්යේෂණයෙන් අනාවරණය කර ගන්නා ලදී. පර්යේෂකයා විසින් පුස්තකාල හා ක්ෂේත්‍ර අධ්‍යයන ඔස්සේ රැස්කරගන්නා ලද දත්ත තේමාත්මක ව විශ්ලේෂණය කෙරිණි. ඒ අනුව අටමඟලෙහි භාවිතය හා උපයෝගීතාව උඩරට, පහතරට හා සබරගමු වශයෙන් සම්ප්‍රදායානුකූල විවිධතා ප්‍රකට කරන්නේ ද යන පර්යේෂණ ගැටලුව සාධනය කර ගනු වස් ප්‍රධාන තේමා තුනක් යටතේ දත්ත විශ්ලේෂණය සිදු විය.

### 3.1 සූනියම් යාගයේ අටමඟල නිර්මාණය

සූනියම් ශාන්තිකර්මය ශ්‍රී ලංකාවේ උඩරට, පහතරට හා සබරගමු යන නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයට ම ආවේණික වුව ද, එය වඩාත් ප්‍රචලිත වන්නේ පහතරට ප්‍රදේශවල ය. මාතර හා බෙන්තර වශයෙන් ප්‍රධාන ප්‍රභේද ද්විත්වයක් මූලික කර ගනිමින් සිදු කරනු ලබන පහතරට සම්ප්‍රදායේ සූනියම් ශාන්තිකර්මයේ නිර්මාණය කරනු ලබන අටමඟල ද ඒ ඒ ශෛලීන් අනුව එකිනෙකට වෙනස්වෙමින් නිර්මාණය කෙරේ. පහතරට ප්‍රවීණ යාග ඇදුරු, පාරම්පරික නර්තන ශිල්පී හර්බට් දයාසීල පෙන්වා දෙන ආකාරයට "අටමඟල" යනු සූනියම් යාගයේ ප්‍රධාන සැරසිල්ලට "සූනියම් වීදියට" මූලික පදනම සකසන ප්‍රධාන සැකිල්ල යි (හර්බට් දයාසීල, ස.සා, 2022.06.12).

පහතරට සූනියම් ශාන්තිකර්මය මෙන් ප්‍රචලිත නො වුණ ද සබරගමු බඹපාද වීදිය හෙවත් සූනියම් යාගයේ ද, උඩරට සූනියම් යාගයට ද සකස්කරනු ලබන මූලික සැරසිල්ලේ පදනම වන්නේ මෙම අටමඟල යි. සමචතුරස්‍රාකාරව මුළු අටක් සිටින සේ බෙදමින් පොළවට සම්බන්ධ කිරීමකින් තොරව අටමඟල සැකසීම පහතරට, සබරගමු හා උඩරට සූනියමේ අටමඟල නිර්මාණ තාක්ෂණය වුව ද, උඩරට සම්ප්‍රදායේ සූනියම් ශාන්තිකර්මයේ අටමඟල නම් වූ මූලික සැකැස්ම සමචතුරස්‍රාකාර හැඩයක් නොව අෂ්ටාස්‍රාකාර හැඩයක් සහිත ව සකසනු ලැබීම සුවිශේෂ වේ.

බෙන්තර හා මාතර වශයෙන් ප්‍රදේශීය විවිධතා ප්‍රකට කරන පහතරට සම්ප්‍රදායේ දී බෙන්තර ශෛලීයට සාපේක්ෂ ව මාතර ඇදුරන් අටමඟලෙහි ආකෘතිය තරමක් විශාල කොට සකසනු ලබයි. මූලික සැකැස්ම වන අටමඟලේ ප්‍රමාණය මත සූනියම් වීදියේ ඉදිරිපස සැකසීම තීරණය වේ. මෙය ද සම්ප්‍රදායන් ත්‍රිත්වයට ම පොදු කරුණකි. සූනියම් යාගයේ දී අටමඟල සකස් කිරීමේ අරමුණ වන්නේ ආතුරයාට නැතහොත් සූනියම් යාගය සිදු කිරීමට හේතු සාධකය වන රෝගී පුද්ගලයාට එහි ඇතුළට පිවිස අසුන් ගැනීම සඳහා ය.

පහතරට හා සබරගමු සූනියම් යාගයේ දී මූලික ව නිර්මාණය කෙරුණු අටමඟල අභ්‍යන්තරයෙහි අළුවලින් යන්ත්‍රයක් සටහන් කර ඒ මත පිරුවටයක් හෝ පැදුරක් එළා අතුරයා අසුන් ගැන්වීම සිදු කරයි. එහෙත් එවැනි යන්ත්‍ර සටහන් කිරීමක් උඩරට සූනියම් අටමඟල සැකසීමේ දී දක්නට නො ලැබෙයි. මෙහිදී එම යන්ත්‍රය වීදියේ ඉදිරිපස දොරටුව අභියස සටහන් කරනු ලබයි (ගරුසිංහ, 2007). පහතරට සූනියමේ අටමඟල පාදක කොට ගනිමින් සකසන සූනියම් වීදිය නැතහොත් පහතරට ව්‍යවහාරය අනුව "අටමඟල වීදිය" සියුම් කැටයම්වලින් අලංකාර කොට විචිත්‍රවත් ව සකසනු ලැබුව ද, සබරගමු හා උඩරට සම්ප්‍රදායේ දී එය එතරම් විශේෂ විචිත්‍ර සැරසිලිවලින් සමන්විත නො වේ. සබරගමුවට සාපේක්ෂ ව උඩරට සම්ප්‍රදායේ අටමඟල වීදිය ප්‍රාථමික ලක්ෂණ බහුල ය.

සබරගමුවේ හා පහතරට සූනියම් යාගය සඳහා සැකසෙන මෙම ප්‍රධාන වීදියේ මූලික පදනම

වන "අටමඟලය" සමචතුචතුරස්‍රාකාර හැඩයක් ගනු ලැබුව ද සබරගමු සූනියමේ පාදමේ සිට ඉහළට නිර්මාණය කෙරෙන කොටස පහතරට සූනියමට වඩා වෙනස් ස්වරූපයක් ගනු ලබයි. ඒ අනුව සමචතුරස්‍රාකාර ව එළන ලද මූලික අටමඟල සැකැස්ම ක්‍රමයෙන් තට්ටු තුනක් දක්වා ඉහළට ඔසවා බැඳ ගැනීම පහතරට හා සබරගමු සම්ප්‍රදායන්වල සිදු කළ ද සබරගමුවේ අටමඟල සැකැස්මේ දී එතනින් ඉහළට ද අමතර කෝටු සතරක් බැඳ ශක්තිමත් කර ගැනීමෙන් පසු එම කෝටුවල ඉහළ කොටස් දෙපස සමාන්තරව දෙකට පළා ඒවා ත්‍රිකෝණාකාර තොරණහිස්වලට ගැළපෙන සේ දෙපස කෝටුවල කොටස් දෙක එකට එකතු කර ඉහළින් බැඳගනු ලබයි. මෙම ක්‍රමය අට පැත්තට ම සිටින සේ යොදා ගැනේ (දිසානායක, 2000). මෙම ලක්ෂණය පහතරට හා උඩරට අටමඟලේ දක්නට නො ලැබෙන සබරගමු අටමඟල සැකැස්මට ම ආවේණික වූ ලක්ෂණයක් වශයෙන් හඳුනාගත හැකි ය.

උඩරට සූනියම් අටමඟල මෙලෙස පහතරට හා සබරගමු අටමඟල මෙන් විධිමත් බවක් පෙන්නුම් නො කර යි. එය අෂ්ටාස්‍රාකාර ව සකසන ඉතාමත් ප්‍රාථමික සැරසිල්ලකි. පහතරට හා සබරගමුවේ මෙන් තට්ටු ආකාරයට ඉහළට බැඳීමක් හෝ අලංකාර කිරීමක් එහි දක්නට නො ලැබේ.

### 3.2 අටමඟල නිර්මාණය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය

ශාන්තිකර්මයන්හි ඇතුළත් සැරසිලි සඳහා බහුල ව භාවිත වනුයේ ස්වාභාවික පරිසරයෙන් සොයා ගන්නා ලද අමුද්‍රව්‍යයන් ය. ඉන් බහුතරයක් වෘක්ෂලතා ආදිය ඇසුරින් සපයා ගනු ලබන කෝටු, පට්ටා, පතුරු, අතු, කොළ, අල, මල්, වැල්, මද, ගොබ ආදී වශයෙන් විවිධාකාර ව භාවිත කරයි. මෙලෙස ස්වාභාවික පරිසරයෙන් ලබා ගන්නා මෙම ද්‍රව්‍ය ශාන්තිකර්ම සැරසිලිකරණයේ දී භාවිත කිරීමෙන් යහපත් ප්‍රතිඵල ලබාගත හැකි වන බව ගැමි විශ්වාසය වේ (බෙන්තරගේ, 2010).

සම්ප්‍රදායන් ත්‍රිත්වයේ සූනියම් ශාන්තිකර්ම සඳහා සකසන අටමඟල සඳහා මෙවැනි ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිත කිරීම විශේෂ වේ. පහතරට සම්ප්‍රදායේ දී ඉඳි පිති, නලා බට, කෙසෙල් පතුරු, කෙසෙල් බොඩ, පට්ටා ආදිය භාවිත කරමින් අටමඟල නිර්මාණය කරනු ලබයි. සබරගමු සම්ප්‍රදායේ දී ද කෙසෙල් බොඩ කැබලි, කෙසෙල් පතුරු, කැලෑනිය ලී කෝටු, සහ පට්ටා භාවිත කරමින් අටමඟල නිර්මාණය කරන අතර උඩරට සම්ප්‍රදායේ දී කෙසෙල් පතුරු, කෙසෙල් බොඩ ආදිය බහුල ව යොදා සකසන ප්‍රාථමික සැකැස්මක් වශයෙන් අටමඟල නිර්මාණය වේ.

සූනියම් වීදිය යනු මෙම ශාන්තිකර්මයට ආවේණික වූ ප්‍රධාන රංග සැරසිල්ල යි. එම සැරසිල්ල අටමඟල නම් වූ මූලික සැකැස්ම පාදක කර ගනිමින් නිර්මාණය කරනු ලබයි. එබැවින් එය "අටමඟල වීදිය" වශයෙන් පහතරට සම්ප්‍රදායේ දී ව්‍යවහාර වේ. ඒ අනුව පහතරට අටමඟල වීදිය හබරල කොළ භාවිත කරමින් සිදු කෙරෙන සියුම් කැටයම්වලින් හා කෙසෙල් පතුරු ගොක්කොළ ආදිය භාවිත කරමින් සකසන නෙළුම් මල් හා යක්තෝඩුවලින් අලංකාර කරයි.

සබරගමුවේ දී ද කෙසෙල් පතුරු ආදිය යොදා සකසන අටමඟල පාදක කොට ගොඩනගන බඹපාද වීදිය හබරල කොළ එලා ආවරණය කොට ත්‍රිකෝණාකාර මුදුන් එලකවලට ගොක්කොළයෙන් සකසා ගත් ගොක් ගෙඩි ගසා ක්‍රෝටන් කොළ වැනි වර්ණවත් ශාක කොළ ආදිය භාවිත කරමින් සරසනු ලබයි. එහෙත් උඩරට සම්ප්‍රදායේ දී පහතරට හා සබරගමුවට සාපේක්ෂ ව අටමඟල මෙවැනි විචිත්‍ර අලංකරණයකට අනුව සැකසීම දක්නට නො ලැබේ. කෙසෙල් බොඩ මත ගොක්කොළ ගසා නෙළුම් මල් ආදිය යොදා ඉතා සුළු වශයෙන් අලංකාර කරනු ලබයි.

සූනියමේ අටමඟල පිළිබඳව සාකච්ඡා කිරීමේ දී අටමඟල සැකැස්ම හා අටමඟල යන්ත්‍රය යනුවෙන් ව්‍යවහාර වන කොටස් ද්විත්වයක් හඳුනාගත හැකි විය. මෙම "අටමඟල යන්ත්‍රය" යනු කොන් අටක් සහිත ව අඳිනු ලබන රූ සටහනකි. පහතරට සූනියම් අටමඟල ඇතුළත ගොම මිශ්‍ර අළුවලින් මෙය සලකුණු කරයි. සබරගමුවේ දී සහල් හෝ පැඟිරි දර වර්ග පහක් පුළුස්සා ලබාගන්නා පස් පැඟිරි අළුවලින් මෙම යන්ත්‍රය සටහන් කරයි. එහෙත් උඩරට සූනියමේ දී මෙම යන්ත්‍රය අටමඟලින් පිටත සහල්, වී, විලඳ ආදිය යොදා ගනිමින් සලකුණු කිරීම සිදු කරයි. එමෙන් ම මෙහි හැඩය ඒ ඒ ශාන්තිකර්ම පවත්වනු ලබන ගුරුකුල අනුව වෙනස් වන බව ද ඇදුරන්ගේ අදහස යි. (හර්බට් දයාසීල, ස.සා, 2022.06.12).

පහතරට සූනියමේ දී මෙලෙස සලකුණු කරන ලබන යන්ත්‍රය "කක්ෂපුට යන්ත්‍රය" වශයෙන් ද සබරගමු සූනියමේ දී "භුවනාධිපති යන්ත්‍රය" වශයෙන් ද උඩරට සූනියමේ දී "අටමඟල යන්ත්‍රය" නමින් ද ව්‍යවහාර කරයි. මෙම යන්ත්‍රය මත ආතුරයා හිඳුවන අතර, ඉන් ආතුරයා හට සෙත් ශාන්තියක් ඇති වී සියලු රෝග එම යන්ත්‍රයට ඇදගන්නා බව පාරම්පරික ඇදුරෝ පෙන්වා දෙති (අචිර තෙන්නකෝන්, ස.සා, 2022.03.01).

මෙලෙස උඩරට, පහතරට හා සබරගමු වශයෙන් සම්ප්‍රදායන් ත්‍රිත්වයේ අටමඟල සඳහා භාවිත වන අමුද්‍රව්‍ය සියල්ල ම ස්වාභාවික පරිසරයෙන් ලබා ගන්නා ද්‍රව්‍ය වුව ද සැරසිලිකරණය අතින් එක් එක් සම්ප්‍රදායට අනුව වෙනස්කම් ප්‍රකට වේ.

### 3.3 අටමඟල හා බැඳුණු අභිචාරමය චාරිත්‍රවිධි

ශාන්තිකර්මයක් විෂයෙහි උපයුක්ත කර ගනු ලබන සැරසිලි හා රංග භාණ්ඩ ඒවායෙන් අපේක්ෂිත අරමුණ සාධනය කරගනු වස් විවිධ චාරිත්‍රවාරිත්‍රවලට අනුගත කොට සැකසිය යුතු වේ. එසේ නොමැති වූ විට නිසි ඵල නො ලැබීම මෙන් ම ආතුර පක්ෂය විෂයයෙහි ලා කායික හා මානසික අභිප්‍රේරණ ද අපේක්ෂා කළ නො හැකි වේ. අධ්‍යයනයට වස්තුවන සම්ප්‍රදායන් ත්‍රිත්වයෙහි දී ම අටමඟල නිර්මාණයෙන් අපේක්ෂිත ප්‍රතිඵල සාධනය කරගනු වස් අභිචාරමය චාරිත්‍ර රැසක් අන්තර්ගත කර ඇත. ඒවා අතුරින් ඇතැම් චාරිත්‍ර ක්‍රම සම්ප්‍රදායන් ත්‍රිත්වයට ම පොදු වන අතර, ඇතැම් ඒවා සුවිශේෂ ව සම්ප්‍රදායානුකූල ව ව්‍යවහාර වේ. විශේෂයෙන් ම පහතරට සම්ප්‍රදායේ සූනියම් යාගයේ දී මාතර හා බෙන්තර ලෙස ප්‍රදේශීය ශෛලීය ප්‍රභේද ද්විත්වයක් පවතින හෙයින් ඊට අනුකූල විවිධතා ද හඳුනාගත හැකි ය. පහතරට දී මෙන් ප්‍රධාන ශෛලීන් ද්විත්වයක් ලෙස නො වූ ව ද සබරගමු සම්ප්‍රදායේ දී දෙහි මඩුව හා බඹපාද කැපීම වශයෙන් ප්‍රධාන ස්වරූප දෙකක් ඔස්සේ සිදු කරනු ලබන හෙයින් එහි ඇති අභිචාරමය චාරිත්‍ර ද එකිනෙකට වෙනස් වේ. මේ අනුව සූනියම් යාගය වඩාත් ප්‍රචලිත ව පවතින පහතරට සම්ප්‍රදායේ අභිචාරාත්මක පූජා චාරිත්‍ර පිළිබඳව පළමුව සාකච්ඡා කර ඉන් අනතුරුව එම චාරිත්‍ර සමඟ සංසන්දනය කරමින් සබරගමු හා උඩරට සූනියම් ශාන්තිකර්මයේ අටමඟල හා බැඳි අභිචාරාත්මක චාරිත්‍ර පිළිබඳ විමර්ශනය කිරීම සිදු වේ.

#### 3.3.1 පහතරට සූනියම් යාගයේ අටමඟල චාරිත්‍ර

සාම්ප්‍රදායානුකූල ව ශාන්තිකර්මයක් පැවැත්වීමේ දී සිදු කරනු ලබන චාරිත්‍ර වාරිත්‍ර රැසක් වේ. එහෙත් මෙහි දී සම්ප්‍රදායන් ත්‍රිත්වයට ම අදාළ ව අටමඟල හා සම්බන්ධ ව සිදු කරනු ලබන සුවිශේෂ අභිචාරාත්මක චාරිත්‍ර පමණක් සාකච්ඡා කර ඇත.

ඒ අනුව පහතරට සූනියම පිළිබඳව අවධානය යොමු කිරීමේ දී මාතර සම්ප්‍රදායේ අටමඟල වීදිය කැප කිරීම අටමඟල හා සම්බන්ධ වන ප්‍රථම චාරිත්‍ර අවස්ථාව ලෙස දැක්විය හැකි ය. බෙන්තර එවැනි චාරිත්‍රයක් සිදු නොවේ. මාතර මෙම චාරිත්‍රය සිදු කරනු ලබන්නේ ආතුරයා නානු ගා, සඳුන් ගා, "මොට්ටැක්කිලි" හෙවත් ආතුරයාට හිසේ සිට පෙරවන පිරිසිදු සුදු රෙද්ද පොරවා පිරිසිදු කිරීමෙන් පසුව ය. මෙහි දී සිදු වන්නේ අටමඟල පදනම කර ගනිමින් සැකසූ අටමඟල වීදිය ඊට අරක් ගත්තා වූ දෙවි දේවතාවුන් හා යකුන්ට කැප කර දීම යි. මෙවැනි අවස්ථාවක් බෙන්තර සූනියම් යාගයේ දක්නට නො ලැබේ.

අටමඟල සම්බන්ධයෙන් වන තවත් චාරිත්‍රයක් වන්නේ මාතර හා බෙන්තර සම්ප්‍රදායන් ද්විත්වයේ දී ම වීදි උපත ගායනා කිරීම යි. අතීතයේ මැණික්පාල බිසවට වසවර්ති විසින් සිදු කළ වින දෝෂය දුරු කිරීම උදෙසා පැවැත් වූ යාගයේ දී සාදන ලද අලංකාර වීදිය පිළිබඳ කවියෙන් විස්තර කීම මෙහිදී සිදු කරයි. එහිදී ගැයෙන වීදි උපත් ගායනය මගින් අටමඟල වීදිය වශයෙන් හැඳින්වෙන මෙම වීදිය සැකසීමේ දී අනුගමනය කරනු ලබන වත් පිළිවෙත් මිමි ප්‍රමාණ හා යොදා ඇති වංගු ගරාදි ආදියත් පිළිබඳ විස්තර කෙරේ.

"විසිපස් රියන් වීදිය පෙර මාලෙ ගනූ
විසි රියනක් ඊළඟ මැද මාලෙ ගනූ
පසළොස් රියන් ඊළඟ උඩු මාලෙ ගනූ
තුන් මල් පාය මේ ලෙස වීදිය බඳි නූ"
(කෝට්ටෙගොඩ, 1997, 92)

මෙම කවියෙන් අනාවරණය වන්නේ පෙර මාල, මැද මාල, උඩ මාල ලෙස රියන් 25 ක්, රියන් 20 ක් හා රියන් 15 ක් වශයෙන් මිමි ප්‍රමාණ තුනකට මහල් තුනකින් යුත් වීදියක් මෙහි දී ඉදි කරන බව යි.

මාතර සම්ප්‍රදායේ දී අටමඟල සම්බන්ධයෙන් වන තවත් එක් ප්‍රධාන චාරිත්‍රයක් වනුයේ දොරටු පැනීම යි. අටමඟල පාදම කොට ගෙන තනා ඇති අටමඟල වීදියේ සිව් කොණ සකසා ඇති දොරටු සතරේ යකැදුරා විසින් වස් හැර දොරටු පැනීම සිදු කරයි. නව නිවසක් ඉදිකර උළුවහු තැබීමෙන් පසුව වඩුවා විසින් උළුවහු පැන දොස් හැරීම නමින් චාරිත්‍රයක් ඉටු කරයි. සූනියම් අටමඟල සම්බන්ධයෙන් වන මෙම දොරටු පැනීම ද, මීට සමාන වන බව පෙන්වා දිය හැකි ය. මෙහිදී ද අපේක්ෂා කරනුයේ ආතුරයාගේ දොස් දුරු කර ගැනීම යි. මෙම චාරිත්‍ර අවස්ථාව අතීතයේ බෙන්තර දක්නට ලැබුණ ද, වර්තමානය වන විට එය වියැකී ගොස් ඇති බව ගරුසිංහ සඳහන් කරයි (2007).

මෙම චාරිත්‍රයෙන් පසුව සූනියම් යාගයේ ප්‍රධානත ම තීන්දු කැපීම ලෙස සැලකෙන හත් අඩි කැපීම සිදු කරනු ලබයි. මෙය මාතර හා බෙන්තර සම්ප්‍රදායන් දෙකෙහි ම දක්නට ලැබෙයි. හත් අඩි කැපීම සිදුහත් කුමරුන්ගේ උපත හා සම්බන්ධ කර ඇති බවත්, සිදුහත් කුමරුන් උපත ලැබූ දිනයේ පියවර හතක් නෙළුම් මල් හතක් මතින් ඉදිරියට ගොස් දෙසන ලද ගාථා පාඨය හා සම්බන්ධ කොට ගනිමින් හත්අඩි කැපීම නම් වූ චාරිත්‍රය ගොඩනගා ගෙන ඇති බව කෝට්ටෙගොඩගේ අදහස යි (1997).

මෙහි දී ආතුරයා හිඳගෙන සිටින ආතුර පන්දලමේ සිට සූනියම් වීදිය නැතහොත් අටමඟල වීදිය දක්වා කෙසෙල් බොඩ මත ගොක් කොළයෙන් කළ අලංකාර පියුම් හතක් එක පෙළට තබා ඇති අතර, මෙම පියුම් තැබීමට පෙර පොළොවේ ඉරි හතක් ඇඳ දෙවනුව එම ඉරි මත පත්‍ර තැබීම සිදු කරයි. මේ සඳහා කෙසෙල් කොළ, දිවි කඳුරු පත්‍ර, මාතර ප්‍රදේශයේ දී ඉඹුල්, දිවුල්, කොලොන්න, නික, බෝ, කරඳ, නුග ආදී වූ පත්‍ර තබනු ලැබේ (ගරුසිංහ, 2007). ඉන් අනතුරුව පෙර සඳහන් කළ පරිදි හත් අඩියට පියුම් තැබීම සිදු කරයි. පසුව හත් අඩියට දොළ පිදේනි තැබීම, පඬුරු තැබීම, දෙහි තැබීම හා බුලත් තැබීම ආදී වූ කටයුතු සිදු වේ. මෙම කටයුතු අවසානයේ අඩියෙන් අඩියට දෙහි කපා ආතුර පන්දලමේ වාඩි වී සිටි ආතුරයා ක්‍රමයෙන් අටමඟල තුළට ඇතුළු කර වීමට කටයුතු කරයි.

පහතරට ප්‍රදේශයේ ඉපැරණි ගෘහ නිර්මාණවල දක්නට තිබූ මැද මිදුල නිවසෙහි විසූ අය මෙන් ම ආගන්තුක සාමාජිකයන් ද ඒකරාශී වන ස්ථානයකි. මෙම ආකෘතිය සූනියමේ අටමඟල සමග ද බැඳේ. අටමඟලට ඇතුළු කළ පසු ආතුරයාට රඟ මඩලේ ඉදිරිපස කෙරෙන වත්පිළිවෙත් මෙන් ම ඇදුරන් හා සෙසු පිරිසගේ සියලු ම හැසිරීම් දෙපසින් දර්ශනය වන බව බෙන්තරගේ දක්වයි (2005). ඒ අනුව හත් අඩියේ තබා ඇති පියුම් හතෙන් එක් එක් පියුම ඉවත් කර දෙහි කපා අවසන් වන විට ආතුරයා සූනියම් වීදියේ දොරටුව අබියසට පැමිණ ඇත. අනතුරුව ආතුරයා අතට පන්දමක් දී අටමඟලේ දොරටුව වටා ඇද ඇති කන්‍යා නූල් නවපොට පුළුස්සන අතර පසුව දකුණු කකුළ පෙරට තබා අටමඟල තුළට ඇතුළු කරවනු ලබයි (කාරියවසම්, 1996).

පාරම්පරික පහතරට බෙර වාදන ශිල්පී සරත් ගුරුතුමා පෙන්වා දෙන්නේ අටමඟලට ඇතුළු කළ ආතුරයා එහි එළා ඇති සුදු පිරුවටය මත හිඳුවනු ලබන බව යි (සරත්, ස.සා, 2022.06.12). මෙය බෙන්තර සම්ප්‍රදායේ ද දක්නට ලැබේ. මේ අයුරින් ම එදා මහා සම්මත රජුගේ බිසව වූ මැණික්පාල බිසවුන් වහන්සේට කරන ලද සූනියම් යාගයේ දී ද රන් පඬුරු, පොල් මල් දැමූ පුන් කළස් ආදිය තැන්පත් කොට ගොම, අළු සහ සහල් මත ඇඳි යන්ත්‍රය මත බිසව හිඳ වූ බව සූනියමේ දී ගැයෙන කවියෙන් විස්තර කරයි.

*'ගොම ද එ සහලුත් අළුගෙන යන්ත්‍රය අඳිමින් නොලසේ*
*රන් පඬුරුත් තබා එමැද බිසවුන් හිඳුවා සතොසේ*
*රන් කළසුත් තබා එවට මාරුක් මල්ලා නොලසේ*
*සැම දොස දුර හරින ලෙසට රුසි යාගය කළයි මෙසේ''*

ආතුරයා අටමඟලට ඇතුළු කර මෝල්ගහ, තොලබෝ, හී රැස්ස, තැඹිලි (පොල්), සහල්, ඊතණ, දිවි හිස, හීන් දෙහි ආදියට උපත් කවි ගායනා කරයි. මෙම සැකැස්ම ද "අටමඟල" නමින් හැඳින්වුව ද, අටමඟල යන්න මෙතැන අර්ථය "අෂ්ට මංගල්‍ය වස්තු යි". අවසානයේ ආතුරයාගේ දෙපා මෙම අටමඟලේ ගස්වා, සිරසපාද කවි ගයා ආතුරයාට සෙත් පැතීම සිදු කරයි (කාරියවසම්, 1996). මෙලෙස අෂ්ට මංගල්‍ය වස්තු පෑග වීමේ චාරිත්‍රය බෙන්තරට ආවේණික වුව ද මාතර සම්ප්‍රදායේ දී දක්නට නො ලැබේ.

හත් අඩි කපා ආතුරයා අටමඟලට ඇතුළු කළ පසුව ද අවශේෂ තීන්දු කැපීම සිදු කරනු ලබයි. අටමඟල තීන්දුව කැපීම හෙවත් අටමඟල වීදිය කපා හැරීම ඉන් එකකි. මෙය අටමඟල සම්බන්ධ ව සිදු කරනු ලබන සුවිශේෂ චාරිත්‍රයකි. මෙහි දී සිදු වන්නේ අටමඟල පදනම කර ගනිමින් ඉදිරියට මාළිගාවක ස්වරූපයෙන් සැකසූ අලංකාර වීදිය කපා හැරීම යි. මාතර සම්ප්‍රදායේ දී මෙය කොටස් දෙකකි. එනම්, චන්ද්‍රගණේ අටකොණ හෙවත් පැඟිරි කෝටු අට කැපීම සහ අටමඟල වීදිය කැපීම යනුවෙනි (ගරුසිංහ, 2007).

අටමඟල කැපීමට පෙර ඇදුරා වරින් වර වීදියට නමස්කාර කරයි. අනතුරුව පන්දම අතට ගෙන අටමඟලට අරක්ගෙන සිටින සියලු ම දෙවි දේවතාවුන්, යක්ෂ යක්ෂණියන්ට ඉන් ඉවත් වන ලෙසට කවි ගායනා කරනු ලබයි.

"ඉන්ද්‍ර දිගින් ආ යකුන්ඩ
දොළ වෙන වෙන සරා දෙන්ඩ
ලෙඩ කළ අය බාර ගන්ඩ
අටමඟලෙන් ඉගිල යන්ඩ"
(කාරියවසම්, 1996, 183).

පැඟිරි කෝටු අටක් ගසා ඒ මත දෙහි ගෙඩි අටක් සවිකොට සැකසූ අටමඟල සැකැස්මෙහි දෙහි ගෙඩි කැපීම මෙහි දී පළමුව සිදුවන අතර, ඉන් අනතුරුව අටමඟල මූලිකකොට සැකසූ අලංකාර වීදිය ආතුරයා අටමඟල තුළ හිඳුවා සිටිය දී ම කපා දැමීම සිදු කරනු ලබයි (ගරුසිංහ, 2007).

බෙන්තර සම්ප්‍රදායේ දී ද පළමුව අටමඟලෙහි පැඟිරි කෝටු අට මත ගසා ඇති දෙහි කැපීම සිදු කරයි. අනතුරුව පෙර සඳහන් කළ පරිදි ම අටමඟලට අරක්ගත් යකුන්, යක්ෂණියන්, දෙවි දේවතාවන් ඔවුන්ගේ විමානවලට පිටමන් කර ආතුරයා අටමඟල තුළ සිටිය දී ම අටමඟල වීදිය කපා හැරීම සිදු කරනු ලබයි.

මේ සඳහා විශේෂ වරම් ගැනීමක් අවශ්‍ය වන බව යකැදුරන් විශ්වාස කරනු ලබන අතර අතට පිහියක් හෝ කඩුවක් ගෙන බියකරු වෙස් මවා ගනිමින් තාණ්ඩව ගණයේ ලා ගැනෙන අංග චලන හා වේග රිද්ම රටාවලින් යුතු නැටුමකින් වීදිය කපා දමයි (කෝට්ටෙගොඩ, 1997).

### 3.3.2 සබරගමු බඹපාද කැපීමේ ශාන්තිකර්මය හා දෙහි මඩුව ශාන්ති යාගයේ අටමඟල චාරිත්‍ර

පහතරට සම්ප්‍රදායේ දී අංග සම්පූර්ණ වත්පිළිවෙත් හා සැරසිලි සහිත ව සිදු කරනු ලබන සූනියම හා හත් අඩි කැපීම සමග අදාළ මූලික වත් පිළිවෙත් පමණක් ඇතුළත් ව විචිත්‍ර සැරසිලිවලින් තොර ව කරනු ලබන ''සූනියම් යාගය'' ට සමානවන ශාන්තිකර්ම ද්විත්වයක් සබරගමු සම්ප්‍රදායේ දී ද දක්නට ලැබෙයි. මිනිසුන්ට ඇති වන වින දොස් දුරු කර සෙතක් ශාන්තියක් ලබා ගැනීමේ පරමාර්ථයෙන් පවත්වනු ලබන මෙම ශාන්තිකර්ම ද්විත්වය අලංකාර සැරසිලි සහිත ව සියලු පුද පූජා චාරිත්‍ර සමග කෙරෙන ''බඹපාද කැපීමේ'' ශාන්තිකර්මය සහ දෙහි කැපීමට පමණක් මූලිකත්වය ලබා දෙමින් අලංකාර සැරසිලිවලින් තොරව කෙරෙන ''දෙහි මඩුව'' ශාන්තිකර්මය යනාදී වශයෙන් ආකාර දෙකකට සිදු කරනු ලබයි. බඹපාද කැපීම පහතරට සූනියමට ම සමාන වූවක් වශයෙන් ගරුසිංහ දක්වා ඇත (2007).

සාම්ප්‍රදායික සබරගමු දෙහි තොවිල් ඇදුරු තිලකරත්න ගුරුතුමාගේ අදහස් අනුව පැහැදිලි වන්නේ අළු පුහුල් කැපීම, වැල් වළලු කැපීම ආදී වූ අංග ඇතුළත් ව දෙහි මඩුවට වඩා විශාල වන ශාන්තිකර්මයක් සබරගමුවේ පවතින බවයි. ''දෙහි මඩුව'' නැතහොත් ''දෙහි තොවිලය'' වර්තමානයේ දී පවා සබරගමුවේ ප්‍රචලිත ව පැවතිය ද, බඹපාද කැපීම නම් වූ ශාන්තිකර්මය දක්නට නොමැති බව සහ ඒ පිළිබඳ නිසියාකාර අවබෝධයක් සහිත ඇදුරන් නොමැති බව ද එම ඇදුරාගේ අදහස යි (තිලකරත්න, ස.සා, 2023.01.14) .

දෙහි මඩුවේ හා බඹපාද කැපීමේ පූජා චාරිත්‍ර පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ද පැහැදිලි වන්නේ අටමඟල එම ශාන්තිකර්ම ද්විත්වයේ ම චාරිත්‍ර සමග බැඳී පවතින බව යි. ඒ අනුව බඹපාද වීදිය නැතහොත් සබරගමු සූනියමේ පූජා චාරිත්‍ර නානු ගා ඇදුරා පේ වීමෙන් නැතහොත් පිරිසිදු වීමෙන් ආරම්භ වේ. අනතුරුව ආතුරයා ආතුර පන්දලමෙහි වාඩි කර වීම, පහන් පත්තු කිරීම, කඩතුරා ඇල්ලීම, මඟුල් බෙර වාදනය, දෙවියන්ගෙන් අවසර ගැනීම ආදී වූ මූලික චාරිත්‍රවලින් පසුව ඡේදන වීදියට නැතහොත් පෙර සඳහන් කළ බඹපාද වීදියට සහල් පඬුරු පිදීම, සත් අඩි උපත, සත් අඩි තැබීම, නානුමුරකර අතුරයා පවිත්‍ර කිරීම, අටමඟලයේ කවි කීම, වංගෙඩියේ උපත් කවි

ගායනා කිරීම, ගිරා උපත් කවි කීම, අතුරයා අටමඟල තුළට යැවීම හා දොරටු පැනීම, වැල් වළලු පැළඳ වීම හා ඔටුනු මාලය, වැල් වළලු කැපීම, අෂ්ටමංගල වස්තුන්ට දෙපය තැබවීම ආදී වූ චාරිත්‍රවලින් පසුව අවසානයේ දී අඹ අත්තෙන් මතුරා පුද පඬුරු ලබා ආතුරයා ගෙට යැවීම සිදු කරනු ලබයි (ගරුසිංහ, 2007).

දෙහි මඩුවේ දී ද බඹපාද වීදියේ මෙන් අටමඟල හා සම්බන්ධවන චාරිත්‍ර එලෙසින් ම අන්තර්ගත වේ. අටමඟලේ කවි කීම, අටමඟල පෑගවීම ශාන්තිකර්ම ද්විත්වයේ ම දක්නට ලැබුණ ද, අටමඟල තුළට ආතුරයා ඇතුළු කරවීම බඹපාද වීදිය ශාන්තිකර්මයේ දී පමණක් සිදු වේ. මේ අනුව බඹපාද වීදිය ශාන්තිකර්මයේ දී ආතුරයා ඇතුළු කරවීමට හැකිවන ආකාරයේ අටමඟලක් සකස් කෙරෙන බැවින් පහතරට දී මෙන් ආතුරයා අටමඟල තුළට ඇතුළු කරවීම, දොරටු පැනීම ආදී වූ චාරිත්‍ර මෙහි දී ද ඉටු කරනු ලබයි.

මෙහිදී ද හත් අඩියේ දෙහි කැපීමෙන් පසු මාතර පළාතේ දී කන්‍යා නූල් පොටවල් පුළුස්සා දමා අටමඟලට ඇතුළු වූවා මෙන් බඹපාද වීදියේ සිව් කොණෙහි දොරටු වසා ඇද ඇති නූල් පොටවල් කඩා අටමඟල තුළට ඇතුළු කරවයි. අනතුරුව ශාන්තිකර්මය සිදු කරන ඇඳුරා නැතහොත් කට්ටඩි මහතා දොරටු පැන වස් හැරීම සිදු කරයි (ගරුසිංහ, 2007). ආතුරයා අටමඟල තුළට ඇතුළු කර වීමෙන් පසුව එහි ඇතුළත අළුවලින් ඇඳි යන්ත්‍රය මත එළා ඇති පන් පැදුරේ වාඩි කරවයි. මෙය " භුවනාධිපති යන්ත්‍රය" ලෙස හඳුන්වනු ලබයි (දිසානායක, 2000). බඹපාද වීදියක් නොමැති ව කරනු ලබන දෙහි මඩුවේ දී ද ආතුරයා හිඳුවන්නේ බිම අළුවලින් හෝ සහල්වලින් ඇඳි මෙම යන්ත්‍රය පිට එළන ලද පැදුරක ය. අනතුරුව බඹපාද වීදියෙහිදීත්, දෙහි මඩුවේදීත් අටමඟල පෑගවීම නැතහොත් අෂ්ටමංගල වස්තු පෑගවීම නම් වූ චාරිත්‍රය ඉටු කරනු ලබයි. පොල්, මෙහොල්, තොලබෝ, හීරැස්ස, දිවි හිස, පඬුරු, සහල් , බුලත් ආදී වූ වස්තූන්ට ආතුරයාගේ දෙපා තැබවී ම මෙහි දී සිදු වේ. එමෙන් ම මෙම එක් එක් මංගල වස්තුවට අදාළ කවි ගායනා කිරීම ද දක්නට ලැබෙයි.

දෙහි මඩුවේ දක්නට ලැබෙන විශේෂ චාරිත්‍රයක් ලෙස අළුවලින් හෝ සහල්වලින් ඇඳි අටමඟල යන්ත්‍රය මැද වංගෙඩියක් මුනින් අතට නැතහොත් වංගෙඩියේ කට බිමට සිටින ආකාරයෙන් තබා, බුලත් කොළයක් මත පහන් තිරයක් හා දෙහි ගෙඩියක් තබා ආතුරයා අතින් එම තිරය දල්වා ඇදුරා විසින් එය ගෙනගොස් වංගෙඩිය ඔසවා වංගෙඩියේ යට තබා වැසීමේ සිරිතක් දක්නට ඇත. මෙම චාරිත්‍රය "අටමඟලට පඬුරු යට කිරීම" ලෙස හඳුන්වා ඇත (දිසානායක, 2000). අනතුරුව ඇදුරා විසින් " බුද්ධ රත්නයේ ධම්ම රත්නයේ සංඝ රත්නයේ බලයෙන් සියලු දෝෂ දුරුවේවා කියා සිතා ගෙන මෙතනින් වාඩි වෙන්න" කියා ආතුරයා අටමඟල යන්ත්‍රය පිට එළා ඇති පැදුර මත ඉඳ ගැනීමට සැරසෙන විට වංගෙඩිය පෙරළා දැමීම සිදු කරයි. ගරුසිංහ සඳහන් කර ඇත්තේ ද සබරගමු බඹපාද කැපීමේ ශාන්තිකර්මයේ දී ද ආතුරයා අටමඟලට යන තෙක් ම අටමඟලේ මැද වංගෙඩිය තබා ආතුරයා අටමඟලට ඇතුළු වන විට වංගෙඩිය පෙරළා දැමීම සිදු කරන බවයි (2007). පාරම්පරික දෙහි මඩු ඇදුරු තිලකරත්න ගුරුතුමා පෙන්වා දෙන්නේ පුරාවෘත්ත කථාවට අනුව මැණික්පාල බිසවට වන් වින දෝෂ දුරු කිරීමට වංගෙඩිය භාවිත කළ සේ ම අද වන විටත් පාරම්පරික සිරිතට අනුව වංගෙඩිය දොස් පහකර යැවීමට භාවිත කරන බව යි (තිලකරත්න, ස.සා, 2023.01.14).

යාගය අවසානයේ දී සියලු වත්පිළිවෙත් නවතා ආතුරයා බඹපාද වීදියෙන් පිටතට ගෙන, අඹ අත්තක් ගෙන මතුරා පිරිත් කියා, ආතුරයාට යන්ත්‍ර දමා යාගය හමාර කරයි. මෙහිදී පහතරට සම්ප්‍රදායේ දී මෙන් සම්පූර්ණයෙන් බඹපාද වීදිය කපා හැරීමක් සිදු නො කරන අතර, යාගය හමාර කර තිස් පැයකින් පසුව එම වීදිය කඩා තුංමංසලකට හෝ ගලා යන දිය පහරකට දමයි (රාජපක්ෂ, 2014).

### 3.3.3 උඩරට සූනියම් යාගයේ අටමඟල චාරිත්‍ර

උඩරට සම්ප්‍රදායයේ පවත්වන සූනියම් යාගය පුද පූජා චාරිත්‍ර සකසා ඇති පිදවිලිවලට සහ අටමඟලට මතුරා දුම් ඇල්ලීමෙන් ආරම්භ වේ. අනතුරුව පහතරට හා සබරගමුවේ මෙන් ආතුරයා අටමඟලට ඇතුළු කර වීමට ප්‍රථම හත් අඩි කැපීම සිදු කරයි.

පාරම්පරික නර්තන ශිල්පී අචිර තෙන්නනකෝන් පෙන්වා දෙන්නේ ආරම්භයේ සිට හත් අඩි කැපීම වන තෙක් සිදු කළ චාරිත්‍ර සියල්ලක් ම දෙවියන් මූලික කර සිදු කරන අතර, හත් අඩි කපා, උඩරට සූනියමට ආවේණික වූ අස්නය නැමැති නර්තනයෙන් පසු ආතුරයා අටමඟල වෙත ගෙන එනු ලබන්නේ

යක්ෂයන්ට ආරාධනා කිරීම සඳහා වන බව යි (අචිර තෙන්නකෝන්, ස.සා, 2022.03.01). අටමඟලට ආතුරයා ඇතුළු කළ පසු අටමඟල තුළ සිටින ආතුරයා සියලු බලවේගයන්ගෙන් ආරක්ෂා වනවා යන විශ්වාසය මෙහි දී මූලික වේ.

මෙවැනි ම විශ්වාසයක් පහතරට සූනියමේ අටමඟල සම්බන්ධයෙන් ද පවතී. එහෙත් ආතුරයා අටමඟලට ඇතුළු කර වන විට පහතරට දී හා සබරගමුවේ දී මෙන් විශේෂ චාරිත්‍ර කිසිවක් මෙහි දී සිදු නො කරයි. පහතරට හා සබරගමුවේ මෙන් නොව මෙහි දී හත් අඩි කපා අටමඟල තුළට ඇතුළු කළ ආතුරයා අවසානයේ දී ඉන් ඉවතට ගනු ලබයි. අනතුරුව දෙවියන්ට විමන්වලට වඩිනා ලෙස කවි ගායනා කොට ආතුරයාට සෙත් කර යාගය අවසන් කරයි (ගරුසිංහ, 2007). යාගය අවසානයේ දී පහතරට මෙන් අටමඟල කපා දැමීමක් මෙහි දී සිදු නො වන අතර, සබරගමු සම්ප්‍රදායේ දී මෙන් එය තුංමංසලකට ගෙන ගොස් දැමීම සිදු කරයි.

පහතරට සම්ප්‍රදායට ම ආවේණික ව තිබූ සූනියම් ශාන්තිකර්මය පසු කාලීන ව සබරගමු හා උඩරට ප්‍රදේශවලට ව්‍යාප්ත වීමෙන් පසුව එම සම්ප්‍රදායයන්ට හා ගුරුකුලවලට අනුගත වන ආකාරයෙන් විවිධ වෙනස්කම් සහිත ව ව්‍යාප්ත වී ඇති බව හර්බට් දයාසීල ඇදුරාගේ මතය වේ (හර්බට් දයාසීල, ස.සා, 2022.06.12). එම වෙනස්කම් කෙසේ වුව ද අටමඟල පහතරට, සබරගමු හා උඩරට යන සම්ප්‍රදායන් ත්‍රිත්වයට ම පොදු වූවක් බව උක්ත දත්ත විශ්ලේෂණයෙන් පැහැදිලි වේ.

මීට අමතර ව බලි යාගයේ දී අටමඟල ලෙස ව්‍යවහාර කරනු ලැබූ කළාලයක් මත සහල් අතුරා ඒ මත කොන් අටක් සහිත ව ඇඳි යන්ත්‍රය මත පොල්, මෙහොල්, තොලබෝ, හීරැස්ස, දිවි හිස, දිවිකදුරු, පඬුරු කාසි ආදී වූ මංගල වස්තු තැන්පත් කර සකසන අටමඟල ද සූනියම් ශාන්තිකර්මයේ දක්නට ලැබෙයි. එම සැකැස්ම හා සම්බන්ධ වන අභිචාරමය චාරිත්‍ර ද සම්ප්‍රදායයන් ත්‍රිත්වයෙහි ම පවතියි. එහෙත් සූනියමේ දී එය අටමඟල නොව, අෂ්ට මංගල වස්තු වශයෙන් හැඳින්වේ. මේ සඳහා භාවිත වන වස්තු සංයුතිය සම්ප්‍රදායානුකූල ව වෙනස් ය. එය පහත සඳහන් වගුවෙහි විශ්ලේෂණය කර ඇත.

**වගු අංක 1.** සම්ප්‍රදායන් ත්‍රිත්වයෙහි භාවිත වන අෂ්ට මංගල වස්තු

| පහතරට සූනියම් යාගය | සබරගමු සූනියම් යාගය | උඩරට සූනියම් යාගය |
|---|---|---|
| මෝල්ගස | මොහොල්ගස | මොහොල්ගස |
| තොලබෝ | තොලබෝ | තොලබෝ |
| හීරැස්ස | හීරැස්ස | හීරැස්ස |
| පොල් | පොල් | පොල් |
| සහල් | සහල් | සහල් |
| ඊතණ | - | - |
| දිවි හිස | දිවි හිස | - |
| දෙහි | දෙහි | - |
| දිවි කදුරු | දිවිකදුරු | - |
| රත්රන් | - | - |
| පනම් | - | - |
| පඬුරු | පඬුරු | පඬුරු |
| පොරි | - | - |
| වී | - | වී |
| බුලත් | බුලත් | බුලත් |
| - | - | හක්ගෙඩිය |
| - | - | පිච්චමල් |
| - | - | වංගෙඩිය |
| - | - | පහන |

ඉහත වගුවෙහි සඳහන් වන වස්තු සංයුතිය උඩරට, පහතරට හා සබරගමු වශයෙන් ගොඩනැගී ඇති සාම්ප්‍රදායික වෙනස්කම් මත පදනම් වෙමින් විවිධ වන අතර, මෙම වස්තු සියල්ල ම අෂ්ට මංගල වස්තු ලෙස සූනියම් ශාන්තිකර්මය සඳහා භාවිත නො වේ. ඒ ඒ

ගුරුකුල අනුව, සම්ප්‍රදාය අනුව, ප්‍රදේශ අනුව වෙනස් වෙමින් මෙම වස්තු අතුරින් වස්තු අටක් පමණක් තෝරාගෙන භාවිත කිරීම සිදු වෙයි. ඒ අනුව සූනියම් ශාන්තිකර්මයේ දී අටමඟල වශයෙන් හා අෂ්ටමංගල වස්තු වශයෙන් කොටස් ද්විත්වයක් පැහැදිලිව හඳුනාගත හැකි වන බව අනාවරණය වේ.

## 4. නිගමන සහ නිර්දේශ

රංග සැරසිලි යනු ශාන්තිකර්මයක අභිප්‍රේතාර්ථයන් මුදුන් පමුණුවාලීමෙහි ලා උපයුක්ත වන වැදගත් අංගයකි. වස් දොස් දුරු කිරීම මූලික පරමාර්ථ කොට ගත් සූනියම් ශාන්තිකර්මයෙහි භාවිත අටමඟල ද එවැනි විශේෂ රංග සැරසිල්ලක් ලෙස ශාන්තිකර්ම විෂයයෙහි ලා සැලකේ. වස් දොස් දුරු කිරීම උදෙසා සිදු කෙරෙන ශාන්තිකර්ම වන බලි යාගය, සූනියම, සන්නියකුම, කළු කුමාර යාගය, හත් අඩියේ දෙහි කැපීම, කඩවර කංකාරිය, කොහොඹා කංකාරිය, දෙහිමඩුව වැනි ශාන්තිකර්මවල අටමඟල භාවිත වීම දක්නට ලැබෙයි. මෙකී ශාන්තිකර්ම තරම් ප්‍රචලිත නො වූ සොහොන් යක්ෂයාට පිදේනි ලබා දීම, තොටයක් තොවිලය වැනි ශාන්තිකර්ම අවස්ථා ද අටමඟල භාවිත ශාන්තිකර්ම වශයෙන් අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය.

එක් එක් ප්‍රදේශවලට ආවේණික වූ විවිධ ශාන්තිකර්මවල දී අටමඟල භාවිතයට ගනු ලබන ස්වභාවය මත එහි සැකැස්ම හා ව්‍යුහය එකිනෙකට වෙනස් වන බව අධ්‍යයනයේ දී අනාවරණය කර ගන්නා ලදී. ඒ අනුව අටමඟලය යැයි ව්‍යවහාර කරනු ලබන රංග සැරසිල්ල සූනියම් යාගයේ දී කෙසෙල් බොඬ, කෙසෙල් පතුරු, කෝටු ආදිය භාවිත කොට සකසන සැරසිල්ලක් වශයෙන් ද, එම සැරසිල්ල මත අඳිනු ලබන රූප සටහනක් නැතහොත් යන්ත්‍රයක් වශයෙන් ද, කළාලයක් නොහොත් පැදුරක් එළා ඒ මත සහල් අතුරා එහි කොන් අටක් සහිත යන්ත්‍රයක් ඇඳ, පොල්, මොහොල්, හීරැස්ස, දිවි හිස, තොලබෝ ආදිය තැන්පත් කර ආතුර දෙපා තැබ වීමට සකසන සැකැස්මක් වශයෙන් ද හඳුනාගත හැකි ය.

එහෙත් සම්ප්‍රදායයන් ත්‍රිත්වයේ ම සූනියමේ දී අටමඟල වශයෙන් ප්‍රධානව හඳුන්වනුයේ ඉහත සඳහන් කළ පරිදි කෙසෙල් බොඬ, කෙසෙල් පතුරු, කෝටු ආදිය යොදා ගනිමින් ආතුරයාට ඇතුළත ඉඳ ගැනීමට හැකිවන සේ සැකසූ ගෘහයක් මෙන් වූ සැකැස්ම යි. සූනියම් යාගයේ ප්‍රධානතම සැරසිල්ල වන "සූනියම් වීදියට" පාදක වන මූලික පදනම වනුයේ මෙකී අටමඟල යි. මෙය උඩරට හා සබරගමු සූනියමේ ද හඳුනාගත හැකිය.

අටමඟලය තුළ අඳිනුයේ අටමඟල යන්ත්‍ර යනුවෙන් ද, කක්ෂපුට යන්ත්‍රය යනුවෙන් ද, භුවනාධිපති යන්ත්‍රය යනුවෙන් ද විවිධ මත වාද පැන නැගී ඇත. එම ව්‍යවහාරය සම්ප්‍රදාය අනුව වෙනස් වනු ඇත. මෙම සැකැස්මට හා යන්ත්‍රයට අමතර ව පොල්, මොහොල්, තොලබෝ, හීරැස්ස ආදිය තබා සැකසෙන සැකැස්ම ද අටමඟලය ලෙස හැඳින් වුව ද, සූනියම් ශාන්තිකර්මයේ දී එය අෂ්ට මංගල වස්තු ලෙස ව්‍යවහාර කරනු ලබයි.

ප්‍රධාන වශයෙන් සූනියම් ශාන්තිකර්මයේ දී රෝග දෝෂ දුරු කිරීමේ අරමුණෙන් සකසනු ලබන අටමඟල හා බැඳුණු චාරිත්‍ර විශේෂ වේ. මෙහි දී දක්නට ලැබෙන එක් විශේෂත්වයක් වශයෙන් අටමඟල නම් වූ ගෘහයක් ලෙස සැකසූ සැකැස්ම තුළට ආතුරයා ඇතුළු කරවීම දැක්විය හැකි ය. එමෙන් ම යාගය අවසානයේ දී අටමඟල කපා දැමීමක් සිදුකරනු ලබයි. පහතරට දී සම්පූර්ණයෙන් ම අටමඟල කපා දැමුව ද, සබරගමුවේ දී හා උඩරට දී මෙලෙස සම්පූර්ණයෙන් අටමඟල කපා දැමීමක් සිදු නො වන බව ද අධ්‍යයනයෙන් අනාවරණය විය.

එපමණක් නොව පොල්, මොහොල්, තොලබෝ, හීරැස්ස, දිවි හිස, සහල් ආදී අෂ්ටමංගල වස්තු තැන්පත් කර සකසන අටමඟල සැකැස්ම හා සම්බන්ධ වන චාරිත්‍රයේ දී ද එම එක් එක් වස්තුවලට අදාළ උපත් කවි ගායනා කොට, එම වස්තුවලට ආතුර දෙපා තැබවීම සිදු කරනු ලබයි. මෙම චාරිත්‍ර අවස්ථාවේ දී "අටමඟල දැකීමෙන් සියලු රෝග දුරු වේවා" යැයි ඇදුරෝ පවසති. එයින් අනාවරණය වන්නේ ඇදුරෝ මෙම වස්තු මංගල වස්තු ලෙස සලකන බව යි.

ඒ අනුව සූනියම් යාගයේ දී අටමඟල හා අෂ්ට මංගල වස්තු වශයෙන් කොටස් ද්විත්වයක් පැහැදිලිව හඳුනාගත හැකිවන බවත්, සම්ප්‍රදායන් ත්‍රිත්වයේ සූනියම් ශාන්තිකර්මයන්හි භාවිත අටමඟල ඒ ඒ සම්ප්‍රදායේ සූනියම් ශාන්තිකර්මය අනුව හැඩයෙන්, ප්‍රමාණයන්ගෙන්, සැරසිලිවලින් හා අටමඟල හා බැඳි චාරිත්‍ර අනුව එකිනෙකට වෙනස් වන බව ද අධ්‍යයනයෙන් නිගමනය විය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


අලුත්ගේ, එච්. පී. (2020-2021). සිංහල සංස්කෘතිය හා බැඳී අටමඟල පිළිබඳ අධ්‍යයනයක්. *වාර්ෂික පර්යේෂණ සැසිය*, 13-64.

උඩවත්ත, පී. (2006). *වැව්ගම්පත්තුවේ බලිතොවිල්.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කාරියවසම්, ටී. (1996). *සූනියම් කැපිල්ල නම් වූ ශාන්තිකර්ම විග්‍රහය.* කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කුලතිලක, සී ද එස්. (2007). *ලංකාවේ සංගීත සම්භවය.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කෝට්ටේගොඩ, ජී. (2009). සිංහල යාගයේ ඇතුළත් මංගල සංකේත භාවිතය. කෝට්ටේගොඩ, ජී, *සම්භාව්‍ය නර්තන සමීක්ෂා* (305-326). බොරලැස්ගමුව: ජේ. කේ. පබ්ලිකේෂන්.

කෝට්ටේගොඩ, ජී. (1997). *පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය.* කොළඹ: දළුවත්ත ප්‍රින්ටර්ස්.

ගරුසිංහ, පී. එස්. (2007). *සූනියම් කැපීමේ ශාන්තිකර්ම සහ සමාජය.* කර්තෘ ප්‍රකාශනයකි.

ගුණසිංහ, ඒ. (2014). *ශාන්තිකර්ම රෝග ව්‍යුපශමන විධි හා බුදුසමය.* කර්තෘ ප්‍රකාශනයකි.

දිසානායක, එම්. (1996). *දෙමළ හත්පත්තුවේ ඇදහිලි විශ්වාස.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, එම්. (2000). *වින කැපුම් යාග විග්‍රහය.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බෙන්තරගේ, එල්. (2005). *පහතරට ශාන්තිකර්මවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ.* කර්තෘ ප්‍රකාශනයකි.

බෙන්තරගේ, එල්. (2007). රුහුණේ බලියාගවල විශේෂතා. අමරසිංහ, ජේ (සංස්.). *ලංකාවේ බලි ශාන්තිකර්ම (73-94).* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බෙන්තරගේ, එල්. (2010). ශාන්තිකර්මවල භාවිත ශාකමය ද්‍රව්‍යයන්හි ඖෂධීය ගුණාත්මක අගය. *නර්තන ගවේශී,* (123-155)

රාහුල, ඩබ්ලිව්. (1970). *ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය.* කොළඹ: එම්. ඩී. ගුණසේන.

රාජපක්ෂ, එස්. (2014). *සබරගමු නර්තන කලාව.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජයතුංග, එච්. (සංස්.). (1982). *ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය:* පළමුවැනි කාණ්ඩය. කොළඹ: සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

හෙට්ටිආරච්චි, ඩී. ඊ. (සංස්.). (1963). *සිංහල විශ්වකෝෂය* : පළමුවැනි කාණ්ඩය. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

Jinadasa, M. (2016). Bali Rituals and Therapeutic Communication in the Traditional Rural Society in Sri Lanka. *Journalism and Mass Communication,* Vol.6, 679-699. doi:10.17265/2160-6579

Kalinga Dona, L.M. (2016). Bali Healing Ritual in Sri Lanka from a Medical Ethnomusicology Perspective. *Musicological Annual*, 52 (2), 121-136. doi:10.4312